# රත්නපුර ප්‍රාදේශිය සභාවේ 2022.05.27 වන දින මහා සභා රැස්වීම් වාර්තාව

රත්නපුර ප්‍රාදේශිය සභාවේ මහා සභා රැස්වීම 2022.05.27 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක මහතා | ගරු සභාපති |
| 02. | ජී.ජී.ජානක පුෂ්ප කුමාර මහතා | ගරු උප සභාපති |
| 03. | ටී.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | එන්.විජය ශ්‍රී ශාන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | ජී.එච්.රංජිත් ධර්මකීර්ති මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 06. | අයි.වී.අකිල රෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 07. | කේ.රණවක කළුආරච්චි මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 08. | ඊ.කේ.ජී.ප්‍රියන්ත පෙරේරා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 09. | ඒ.දොන්.නිශාන් දමිත් අල්ගම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 10 | යූ.කේ.නන්දාවති මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 11. | මංජුල ශ්‍රීලාල් බී ගමගේ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 12. | කේ.නිරෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 13. | ආර්.බී.නාලක සුදත් ශ්‍රී හේමපාල මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 14. | ඒ.එම්.නිලන්ති මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 15. | කේ.ඒ.ජයරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 16. | පී.වී.ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 17. | ජී.වී.අනුෂ විරාජ් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 18. | පී.උදය කුමාර් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 19. | කේ.වී.කමනි සේනාධීර මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 20. | ගෝපාල් තම්බිරාජා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 21. | බී.ඒ.ලලිත් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 22. | පී.රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 23. | ටී.ජී.ඉන්ද්‍රාණි මැණිකේ මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 24. | ජී.ජී.ලිලානි චන්ද්‍රතිලක මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 25. | ජී.අනුර ප්‍රභාත් අමරවංශ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 26. | ආර්.ඒ.පත්මා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 27. | එම්.වජිරා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 28. | එල්.එම්.තමරා සුභාෂිණී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 29 | කේ.ජී. නිහාල් අමරසිංහ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලා

| | | |
|---|---|---|
| 01. | ඩී.නිලන්ති දීපිකා යසරත්න මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 02. | පී.වී.ඉසුරු ජයලත් විතාරණ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 03. | එම්.ඒ.ඩික්සන් ජයතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | ඒ.එම්.සමන් පාලිත විජේරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | ඕ.කේ.සුගත් ජයවික්‍රම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 06. | බී.ප්‍රියන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 07 | රාමසාමි මෝහන සුන්දරම් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී වූ නිලධාරීන් :-**

01.ජී.යූ.එම්.සී.සිරිවර්ධන මහත්මිය - ලේකම්

02.ජී.එච්.අයි.ඩී.ආරියමිත්‍ර මහත්මිය - සංවර්ධන නිලධාරී

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.04.08 වන දින මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත කුමාර් මහතා යෝජනා කරනු ලැබුවේ කණ්ඩායමක් ලෙස මුදල් කාරක සභාව සඳහා බෙදීමක් ඉල්ලා සිටිය මුත් එය නොලැබුන බවත් ඒ සඳහා කණ්ඩායමක් ලෙස විරුද්ධ වූ බව වාර්තාවේ සටහන් කර සංශෝධනය කරන ලෙසයි. ඒ අනුව සංශෝධිත යෝජනාව ගරු මන්ත්‍රී වී.ජේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

i. භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/CBP/01/01/04-2022 හා 2022.04.26 දිනැති ලිපිය පරිදි නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රෙල්බ අංක 03/2022 අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා ලබා දී ඇති උපදෙස් පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කරන ලදී.

ii. පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/AD/1/3/8 හා 2022.05.25 දිනැති ලි 6පියට අනුව ගරු සභාපති, ගරු මන්ත්‍රීවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ දින 14ක් ඇතුලත පළාත් පාලන ආයතනයට යොමු කිරීම සඳහා කඩිනමින් ලබා දෙනලෙස දැනුම් දෙන ලදී.

**03.ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම.**

**නැත.**

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

**i. රත්නපුර ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන කාර්යාලය පාර්ටීෂන් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව , රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ රජයේ ආයතනවල වියදම් පාලනය කරන ලෙස දැනුම් දී ඇති අවස්ථාවක් බැවින් හා ආයතනයේ මුදල් තත්වය පිළිබඳව සළකා බලා එම යෝජනාව ඉවු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී වරුන්ගේ යෝජනාව පරිදි ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා විසින් ස්ථිර කර ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**05:01** හදිසි යෝජනා

**i. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙන් පැවැත්වීමට නියමිත මානව සම්පත් කළමණාකරණය පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලීම කර ඇති කළමණාකරණ සේවා නිලධාරී අමානි සුගතදාස මහත්මිය , සංවර්ධන නිලධාරී නිම්මි සමුද්ධිකා මහත්මිය , සංවර්ධන නිලධාරී සුරේඛා දමයන්ති මහත්මිය යන අය වෙත පාඨමාලා ගාස්තු ලෙස එක් අයෙකුට රු:- 30000.00 බැගින් රු:-90000.00ක මුදලක් සභා අරමුදලින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව,එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**06.කාරක සභාවල වාර්තා**

2022.04.29 දිනැති මුදල් කාරක සභා වාර්තාව අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත කරන ලදී. මෙම වාර්තාවේ අංක 24 හා 25 කාරණා සම්බන්ධව මුදල් ගෙවීම වෙනුවෙන් විපක්ෂයේ කණ්ඩායම විරුද්ධ බව ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත කුමාර් මහතා සඳහන් කරන ලදී.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

මාසික ආදායම් හා වියදම් සාරාංශ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

**08.ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ කතා**

**i.ගරු මන්ත්‍රී ඒ .එම්. නිලන්ති අමරකෝන් මහත්මිය.**

පසුගිය නව වෙනිදා සිදුවුනු සිද්ධියෙන් පසුව ඒ සඳහා සක්‍රියව දායකවුණු අයගේ නිවෙස් ගිනි තබලා විනාශ කර තිබෙනවා. කුමන ආකාරයට හෝ මේ සිදුවීමට සම්බන්ධ වුවත් නිවෙසක් ගිනිබත් වෙනවා කියන්නේ කෙනෙකුගේ මුළු ජීවිතයම ඒ වගේම ජීවිත නවයක් අහිමි වුනා. මේ අයුරින් ජීවිතය අහිමි වූ නිවෙස් ගිනිබත් වූ සියළුම දෙනාට මම මන්ත්‍රීවරියක් ලෙස කණගාටුවට පත්වන බව එතුමිය පැවසුවාය. රත්නපුර ප්‍රාදේශීය සභාවේ සහභාගී වූ මන්ත්‍රීවරුන්ට ලොකු හානියක් නොවීම පිළිබඳව සතුටට පත්වන බවත්, මොකද මේ සභාවේ ධනවත් මන්ත්‍රීවරුන් නැහැ. හොරකම් කරන්නේ නැහැ හොරකමට අතහිත දෙන්නේ නැහැ. ඒ නිසා සොබා දහමෙන් ප්‍රතිචාර ලැබුණු බව එතුමිය පැවසුවාය. නමුත් ඇතිවෙලා තිබෙන තත්වයට අපේ ප්‍රමාණයෙන් වගකිව යුතු බව එතුමිය පැවසුවාය.

අපේ රටතුළ මේ අර්බුදය ඇති වීමට පසුගිය කාලයේ කොරෝනා වසංගතය හේතුවක් වුණා. ඒ වගේම අයවැය පරතරයක් ඇතිව දිගුකාලීනව වියදම් කිරීම හේතුවෙන් ආර්ථික අර්බුදය ඇති වී තිබෙන බව එතුමිය පැවසුවාය. වාසුදේව ගරු මන්ත්‍රීතුමා මෙම තෙල් අර්බුද අවස්ථාවේදී කූපන් ක්‍රමයක් සකස් කරන ලෙස උපදෙස් ලබාදුන්නත් ඒවා ක්‍රියාත්මක නොවුණු බවත්, ප්‍රාදේශීයව සමුපකාර සේවා ලබාදීම තුළින් සහන සැළසීමට කටයුතු කිරීමටද එතුමා උපදෙස් දුන් අවස්ථාවේදී පුද්ගලික අංශය බිඳ වැටේයැයි ඇතැම් නායකයින් පැවසූ බව එතුමිය පැවසුවාය.

ගෝල්ෆේස් අරගල භූමියේ සිටින පිරිසගේ අදහස්ම පොළවේ සිටින පිරිසගේ අදහස්ම වේනම් එතන සිටිය යුතු බවත්, දේශපාලනය යනු එය බව එතුමිය පැවසුවාය. මෙම හේතුන් නිසා රටම ආදරය කළ නායකයෙකුට තම නිවසේ සිරවී සිටීමට පවා සිදු වූ බවත්, එතුමිය පැවසුවාය. සර්වපාක්ෂික ආණ්ඩුවක් හදන්න කියලා යෝජනා කළත්, ඒ පිළිබඳව අවධානය යොමු කළේ නැහැ අහංකාර කමට , කපුටා කර, කියනවා, කොවුලා කරා කියනවා , කවුරු හෝ හැදුව ආණ්ඩුවක් පාක්ෂික ආණ්ඩුවක් හැදුවා. අන්තිමට මහබැංකු හොරා මුදල් ඇමති වෙනකම්ම හැරුණු බව එතුමිය සඳහන් කළාය.

කණ්ඩායමක් විදියට කටයුතු කලයුතු බවත්, වැරදි වැඩ සඳහා යොමුවිය යුතු නැති බවද, අම්මා කිව්වත් තමන් වැරදි නොකරන බවද එතුමිය පැවසූ අතර, මෙම මේ දේශපාලන වාතාවරණය තුළ මන්ත්‍රීධුරයට පැමිණීම පිළිබඳව ඉතාමත් කණගාටුවක් ඇති වන බව එතුමිය පැවසුවාය.

ජපානයයේ 1-5 දක්වා පාසැල් දරුවන්ට විභාග පවත්වන්නේ නැහැ ඔවුන් සමාජීය වශයෙන් ජීවත් වන ආකාරය පිළිබඳව කන බොන ආකාරය පුරුදු පුහුණු කරන බවද එවැනි සමාජ ආකල්ප මෙරට තුළද ඇතිවිය යුතු බව එතුමිය පැවසුවාය. සල්ලි ටිකක් තිබුනම හැමදේම හරියි සිතන සමාජයක් තිබෙන මෙවැනි රටවල් තුළින් , වැරදි දේ වැරදි බවට පෙන්වන්නට හැකියාවක් නොමැති තත්වයක සොබා දහම ප්‍රතිචාර දක්වන බව එතුමිය පැවසුවාය.

දේශපාලනික වශයෙන් කටයුතු කිරීමේදී තමන් කල දේ හරිද වැරදිද යන්න තම හෘද සාක්ෂියට එකඟව සිතා බැලිය යුතු බවද , නිලධාරීන්ද හරිහැටි රාජකාරී ඉටු කළයුතු බවත් වැරදි කළහොත් අමාරුවේ වැටෙන්නේ තමන් බවද එතුමා පැවසූ අතර, මහජන නියෝජිතයින්ද වැරදි දේ අනුමත කිරීමට කටයුතු නොකළ යුතු බවත්, වැරදි දේ වැපුරුවහොත් නෙලාගන්නට වන්නේද එයම බව එතුමිය වැඩි දුරටත් සඳහන් කළේය.

රත්නපුර ප්‍රාදේශීය සභාව වෙනුවෙන් තමන් සෑම විටම නිවැරදි පැත්තේ සිටින බවත්, තම නායකයා කිසිදු සොරකමකට දායක නොවූ ජීවිත කාලය පුරාවටම ජනතාව වෙනුවෙන් කැපවෙලා තිබෙනවා. ජනතාව කියන දේට ඇහුම්කන් දෙන්න අවශ්‍ය බවද, පොළවේ තිබෙන තත්වය තේරුම්ගෙන කටයුතු කළ යුතු බවද ජනතාව වෙනුවෙන් වගකීම දරණ පිරිසක් ලෙස මන්ත්‍රීවරුන් කටයුතු කළයුතු බව එතුමිය සඳහන් කළේය.

**ii.ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා**

තමන් පොත් පත් කියවන පුද්ගලයෙක් ලෙසට පසුගිය සභා වාර්තාව කියවාගෙන යන අවස්ථාවේදී ඇතැම් අය භාවිතා කර තිබූ වචන පිළිබඳව විමසීමේදී කොතරම් දුරට එම භාවිතාවන් සුදුසුද නැද්ද

යන්නත් එම පුද්ගලයාගේ ප්‍රතිරූපය පිළිබඳව අවබෝධයක් ලබා ගතහැකි බවත් පැවසූ ගරු මන්ත්‍රීවරයා සඳහන් කරනු ලැබුවේ ගල්ලෑල්ල උප කාර්යාලය නීරීක්ෂණයට ගිය අවස්ථාවේදී එම ස්ථානයේ තිබුණු අඩු පාඩු දැක ඒවා සකස් කර දීමට යෝජනා කළ බවත්, තමන්ට හැකි පමණින් වෙනත් අයගේ සහයද ඇතිව පොත් පත් පුස්තකාලයේ පරිහරණය සඳහා ලබා දීමට කටයුතු කරන බවද එතුමා සඳහන් කළේය.

පසුගිය සභාවේදී විජය ශ්‍රී ශාන්ත මන්ත්‍රී තුමා මුදල් කාරක සභාවට ඉදිරිපත් කරන වැය දැරීම් සඳහා අදාල ඉල්ලීම් , නිලධාරීන්ගේ නිර්දේශයන් සමගින් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම නිලධාරීන්ගේ වගකීම බව සඳහන් කර තිබුණා. එය හොඳයි නමුත් , චක්‍රලේඛ වලට අනුව ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන සියළුම දේ අනුමත කිරීම මුදල් කමිටුව ලෙස සිදුකිරීම මුදල් කමිටුවේ වගකීම නොවන බවත්, එම කාරණා සම්බන්ධව විමසීම් කර මෙම අවස්ථවේදී එම කාරණා සිදුකළයුතු දේවල්ද, සභාවේ මුදල් තත්වය කෙසේද  යන්න සොයා බලා අනුමැතිය ලබා දීමේ හැකියාව තිබිය යුතු බවත්, මේ තුළින් ආයතනයේ මූල්‍ය කළමනාකරණය සිදුවන බව එතුමා සඳහන් කළේය. එසේ සිදු නොකිරීමට නම් මුදල් කමිටුවක් අවශ්‍ය  නොමැති බව එතුමා වැඩි දුරටත් පෙන්වා දුන්නේය. සභවේ මන්ත්‍රීවරු සියළුම දෙනාට සහභාගී වීමට නොහැකි නිසා සියළුම දෙනා නියෝජනය කරමින් පත්කර ඇති මන්ත්‍රීවරුන්ගේ වගකීම එය බවත්, එහිදී හරි තීරණය ගනු ලබන්නේනම් නැවත සභාවට යොමු කිරීමට අවශ්‍යතාවයක් ඇති නොවන බව එතුමා සඳහන් කළේය. පසු ගියදා කෝප් කමිටුවේ දී මහබැංකුවේ ගණු දෙනුවලදී ගනු ලැබූ තීන්දු තිරීණ පිළිබඳව විමසීමේදි අද ඒවට පිළිතුරු දීමට සිදුවී තිබෙන්නේ මහබැංකු අධිපති ඇතුළු නිලධාරීන්ට ඒ නිසා ඕඩර් දෙන  ආකාරයෙන්ම නිලධාරීන් කටයුතු සිදුකරන්නට ගොස් ගැටළුකාරී තත්වයන්ට මුහුණ පෑමට සිදුවන්නේ වගවීමට සිදුවන්නේ දේශලපාලකයින්ට නොව නිලධාරීන්ට බැවින් සිදුකරන කාරණා සම්බන්ධව පැහැදිලිතාවයකින් යුතුව කටයුතු කළයුතු බව එතුමා පෙන්වා දුන්නේය. මන්ත්‍රිවරුන්ද ජනතාවට වගවෙන පිරිසක් බවට පත්විය යුතු බවට එතුමා වැඩි දුරටත් සඳහන් කළේය.

මැතකදී සිදුවුණු සිද්ධිය පිළිබඳව කතා කළයුතු වෙනවා. එම තත්වය ඉබේ වුණු දෙයක් නොවෙයි මෙය වළක්වා ගන්නට තිබූ තත්වයක් මේ සම්බන්ධයෙනුන් රූපවාහිනි නාලිකාවල අපේ සභාවේ දන්න කියන මුහුණු කිහිපයක් එහාට මෙහාට ගියා  වාසනාවකට රත්නපුරේ ජනතාව විනාශ කාරී තත්වයන්ට යොමු වුනේ නැහැ. මාධ්‍යයේ සඳහන් කළ පරිදි මිලියන පනහක් පමන මේ විනාශ වූ දේපල පිළිබඳව සඳහන් වුනා.ජීවිත කිහිපයක් විනාශ වුනා ඒවා කණගාටු විය යුතු කාරණා බව එතුමා පැවසුවේය. මෙම සිද්ධිය වෙනුවෙන් පැත්තන සිටි අපිටත් විඳින්නට සිදුවුනා.මොකද මේ විනාශය නිසා ඇති වූ හානිය ආර්ථිකයට බලපෑමක් එල්ල කරමින් වැඩිවන සෑම භාණ්ඩයක් වෙනුවෙන්ම තම දරුවන්ටද මුහුණ දිය යුතු වන බව එතුමා පෙන්වා දුන්නේය. වසර තිහක් තිස්සේ තිබුණු යුද්ධය අවසන් කළ නායකයෙක් අත්දැකීම් රටේ නායකයෝ පිළිම හඳලා වඳින තත්වයක හිටපු කෙනෙක් අන්තිමේදී ගඩාපිටත් වඩා අන්ත තත්වයකට පත් වුන බව එතුමා පැවසුවේය. එදා එතුමාගේ කටින් පැමිණි පිරිස අමතමින්  මාව බලන්න ආවට ස්තූතියි දැන් ගෙදර යන්න කිව්වා නම් අද වන විට කෝට් පන්දහසක් මේ රටට ඉතුරු බව එතුමා පැවසුවේය. කොහොම නමුත් ඒ සිදුවීම අවාසනාවන්ත සිදුවීමක් බවත් .කණගාටුවක් තියෙනවා රත්නපුර ප්‍රාදේශිය සභාවේ කිහිප දෙනෙකුත් මෙයට සම්බන්ධ වී තිබුණ එක. මෙම සිද්ධිය මගේ  මුහුණු පොතේ සටහන් කළා ඒ සඳහා විවිධාකාරයෙන් ප්‍රතිචාර දක්වනවා ඒ විවිධ ප්‍රතිචාර අතරේ සමාජයේ පිළිණු වී ගිය ජාතිවාදය පිළිබඳ කතා යනවා නමුත් අද ජනතාව ඒවයෙන් රැවටීමට බැරි බවත් එම දේවල් තුළින් ජනයා පීඩාවට පත්ව හෙම්බත් වී සිටින බැවින් ඒවායින් ජනතාව අව්ලන්නට නොහැකි වන බවත් එතුමා පැවසූ අතර, තම දේශපාලන මතවාදයන් නොබියව ඉදිරිපත් කරන බවද එතුමා   පැවසුවේය.

**iii.ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා**

මෙම මාසය ඉතා වැදගත් මාසයක් මොකද රටේ දසක තුනක් තිස්සේ තිබුණු යුද්ධය අවසන් කරලා රටට සාමය උදා කළේ මේ මැයි මාසයේදී බව ගරු මන්ත්‍රීවරයා පැවසුවේය. මහින්ද රාජපක්ෂ මහතා 2005 දී මේ රට එක්සත් ශ්‍රී ලංකාවක් බවට පත්කරමින් රටේ ඉදිරියට ගෙන යෑම සඳහා කටයුතු කරනු ලැබුවා. නමුත් යෝධ්‍ය ගෝ හෝම් කියන පිරිස අතරේ මහින්ද රාජපක්ෂ මැතිතුමා දිනාදුන් රට පිළිබඳව හැඟිමක් නොමැති පිරිස් සිටි බව අපිට ජනමාධ්‍ය තුළින් දැකගන්නට ලැබුනා. එක් අවස්ථාවකදී යුද්ධය දිනාගත් දිනය සමරන අවස්ථාවේදී ප්‍රභාකරන් සැමරීමේ කටයුතුද එම ස්ථානයේදී සිදුවුනා. මෙය මහින්ද රාජපක්ෂ මහතා යුද්ධය දිනාදීම ඔහුට ආපස්සට පැමිණිමක්  බව එතුමා පැවසුවේය. කවුරු මොනවා කිව්වත් මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු ආණ්ඩුවක් නොතිබුණා නම් අද රට තිබෙන තත්වයකටවත්  පත් නොවන බව එතුමා පැවසුවේය.

1971 මැතිණිගේ ආණ්ඩුව කාලෙත් ආර්ථිකය කඩා වැටුනු අවස්ථාවක් ලෝකයේම ආහාර අර්බුදයක් තිබූ අවස්ථාවක්. එදා ජනතා විමුක්ති පෙරමුණේ සිරභාරයට ගත් අය හැර බොහෝ පිරිසක් විදෙස් රටවලට පැන ලියා. ඔවුන් අද ඒවායේ පදිංචි කරුවන් වී සිටිනවා. අනුර කුමාර මහත්තයා ජනාධිපති වෙනම් ඉන්නවා ඔවුන් රටට ඩොලර් එවීම සඳහා තරුණයින්ගේ නැගිටීම 88/89 සිදුවුනා එදා ජනාත් විමුක්ති පෙරමුණ ඉගෙන ගන්න එක දෙවනුවට රට පළමුවට කියලා විශාල තරුණ පිරිසක් පාරට බැස්සුවා.මේ රටේ ආර්ථිකය විනාශ වූ අවස්ථා කිහිපයක් තිබුණා එම අවස්ථාවන් වලට ජනතා විමුක්ති පෙරමුණ වගකිව යුතු නැද්ද යන්න ප්‍රශ්නාර්ථයක් බව එතුමා පැවසුවේය. ශුද්ධවූ බිමක් හදන්න ජනතාව සුඛිත මුදිත කරන්න හදන පක්ෂයක් ලෙස කණගාටුවට පත්වන බව එතුමා පැවසුවේය.

පොදු ජන පෙරමුණේ එදා රජ්වීම අවසන් වෙලා මයිනා ගෝ ගමට හා ගෝටා ගෝ ගමට පහර දුන් නිසා මේ තත්වය උදා වුනා යැයි කීවොත් මං එය පිළිගන්නේ නැහැ. මාත් ලිය එදා රජ්වීමට ඇධිරිනීතිය දාපු නිසා දින දෙකක් අරලිය ගහ මන්දිරයේ ඉදලා තමයි ආවෙ.අපි දැක්කා ගෝල් ෆේස් එකේ විපක්ෂ නායක තුමත් දුවනවා , මේවා විලිලැජ්ජ නැති වැඩ හැබැයි අනුර කුමාර මහත්තයට විරෝධතා එල්ල වුනාද නැහැ එයාට මුකුත් කරේ මේ පිළිබඳව කල්පනා කරලා බලන්න ඕනි . මැයි නව වෙනිදා රජ්වීමට යද්දී හිතාගන හිටියෙ ආපහු දේශපාලනය කරන් නෑ කියලා නමුත් මේ සිදුවීමෙන් පසුව හිතුව දේශපාලනය අතාරින් නැහැ ඕනම අභියෝගයනට මුහුණ දෙනවා කියලා. මුහුණු පොතේ ඇතැම් අය දාලා තිබුණා විවිධ දේ ඒ අය ඒවා බලා ගනු ඇති බව එතුමා පැවසුවේය.

මේ රට ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයට හඳන්න බැහැ. ඇතැම් පිරිස් ප්‍රජාතන්ත්‍ර විරෝධි කටයුතු කරන පිරිස් සිටිනවා. නිවෙස් වලට ගිනි තියලා විශාල හානි සිදුකළා ජීවිත අහිමි වුනා මේ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන බව එතුමා පැවසුවේය.මෙම අරගලය තුළ විගණනය කෙරෙන කාරණයක් පිළිබඳව කතා කෙරෙනවා ග්‍රාමීය මට්ටමේ ග්‍රාම නිලධාරීගේ සිට ඉහළ නිලධාරීන් ද විගණනයට ලක්විය යුතු බව එතුමා සඳහන් කළේය. ග්‍රාමීය මට්ටමින් සිදුකළයුතු ව්‍යාපෘති ගණනාවක් යෝජනා කළා නමුත් කිසිදු දෙයක් ඇතැම් ඉහළ රාජ්‍ය නිලධාරීන් මෙන්ම විපක්ෂයේ පිරිස් මේවා සිදු කිරීම සඳහා සහයක් ලබා නොදුන් බව එතුමා පැවසුවේය.

**IV.ගරු අනුර ප්‍රභාත් අමරවංශ මහතා**

විජය ශ්‍රී ශාන්ත මහතාගේ කතාව හොඳයි ගමේ ගොඩේ කිසිම ප්‍රවෘත්තියක් රටේ තොටේ කිසි දෙයක් නොදන්නා පුද්ගලයින් සඳහා ඒ වෙනුවෙන් මං කතා කරන්න කාලය ගන්නේ නැහැ. 88/89 පිළිබඳව ඇති වෙන කම් කතා කරලා තිබෙනවා. ඕක දැන් වලංගු නැහැ අවලංගු කාසියක්. මැයි නව වෙනිදා සිද්ධියට ජනතා විමුක්ති පෙරමුණ සංවිධානාත්මකව සම්බන්ධ යැයි පවසමින් සංවිධානාත්මකව ප්‍රචාරයක් සිදුකරගෙන යන බව එතුමා පැවසුවේය. අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේදී පැවසුවා ජනතා විමුක්ති පෙරමුණේ 150ක පමණ ප්‍රමාණයක් මේ හා සම්බන්ධ වී ඇති බවට ඒ පිළිබඳව පොලිස්පති වරයාගෙන් විමසීමක් කර තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රචණ්ඩ ක්‍රියා කිහිපයක් වෙලා තිබෙනවා. නමුත් අපේ පක්ෂයේ කිසි කෙනෙකු ඒවාට සම්බන්ධ වී නොමැති බව එතුමා පැවසුවේය. මල්වල හංදියේ හර්තාල් ව්‍යාපාරයක් කළා සාමකාමීව සිදුකළේ ඊට පූර්ණ සහය ලැබුණ බවත් එතුමා පැවසුවේය.

නව වෙනිදා සිදුවුණු සිද්ධිය ඉතා කණගාටුදායකයි. මේවාට සම්බන්ධ පිරිස් පිළිබඳව ජනතාව දන්නවා. මෙය වළක්වාගතයුතුව තිබූ සිද්ධියක් රොහාන් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට නමුත් එය විනාශයක් කර සිදුවනකම් කටයුතු කළා. මෙම අරගලයෙන් කියන්නේ ජනතාව මේ වන විට පීඩාවට පත්ව ඇති තත්වයයි. මේ තව තවත් වැඩි වෙනවා මිස අඩු වෙන් නෑ . අරගලය ජයග්‍රහණයකින් කෙළවර වන බව එතුමා වැඩි දුරටත් පැවසුවේය.

හීනෙන් නැගිටලා වගේ රනිල මහත්තයා අගමැති වුනා රනිල් මහත්තයා ආවෙ රටේ ආර්ථික අර්බුදය විසඳීම සඳහා නොවන බවත්, මහින්ද රාජපක්ෂ මහතාගේ පවුල ආරක්ෂා කිරීම සඳහා බවත් එතුමා පැවසුවේය. රටේ ජනතාව අපෙනුත් ප්‍රශ්න කරයි තව ටික දවසකින් , ඔබතුමා ගමේ මිනිස්සු ගාවට ලිහින් ඔය කතා කියන්න , කුමන්ත්‍රණ කාරී ආකාරයට අපිට පහර දෙන වැඩ පිළිවෙළට අපි කියන්නේ මේ ප්‍රචණ්ඩ ක්‍රියා වැඩ වලට අපේ කිසිදු සහයක් නොමැති බවත්, සාමකාමී විරෝධතා පමණක් සිදුකරන බව එතුමා පැවසුවේය. රත්නපුර ප්‍රාදේශිය සභාවේ බල ප්‍රදේශයේ අපි වැඩ කටයුතු කරන ආකාරය සියළුම මන්ත්‍රීවරුන් දන්නා බවත්, කිසිදු ප්‍රචණ්ඩකාරී කටයුත්තකට දායක නොවන බවත් ඔහු පැවසුවේය. එවැනි පහත් දේශපාලනයක් තම පක්ෂය නොකරන බව එතුමා පැවසුවේය.

**v. ගරු මන්ත්‍රී අනුෂ විරාජ් මහතා**

රටේ අර්බුදයක් ඇතිව සිටින වෙලාවක අපි සැම වෙනුවෙන් අරගලයේ පිරිසක් යෙදී සිටියා. යම් කාලයක් අදහසක් තිබුනා යම්කිසි ප්‍රචණ්ඩතවයක් සිදු කිරීම තුළින් දේශපාලන බලය පෙන්වීම නමුත් දැන් එසේ නොමැති බවද, ප්‍රචණ්ඩත්වයට එරෙහිව කටයුතු කිරීමක් සිදුවන බව එතතුමා පැවසුවේය. මේ අවස්ථාවේදී සිදුවූ සිද්ධිය හේතුවෙන් රටට විශාල සේවයක් කළ යුද්ධය අවසාන කළ නායකයෙක් වූ මහින්ද රාජපක්ෂ මහතාට ගෙදර යාමට සිදුවීම කණගාටුවට කරුණක් බව ගරු මන්ත්‍රීවරයා පැවසුවේය.
එක් එක් අයගේ මෝඩ තීරණ නිසා මෙවැනි සිදුවීම් සිදුවනා අවසානෙදී මහින්ද මහත්තායට ඉන්න තැනත් නැති කර දැමීම පිළිබඳව මා ආදරය කරන නායකයෙකුට සිදුවූ දේ පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරමින් කියා සිටියේ ගෙවල් දොරවල් විනාශ කර මෙවැනි අර්බුද කාරී තත්වයන් ඇතිකළ කඩාකප්පල් කාරී පිරිස් වලට සාප වේවායැයි ප්‍රාර්ථනා කළේය.

මේ සිද්ධිය හේතු කරගෙන රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රචණ්ඩත්වයක් ඇති නොවීම පිළිබඳව විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වන බවත්, බලංගොඩ පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මහතාගේ නිවෙසට හානි සිදුකිරීම පිළිබඳවද මේ අවස්ථාවේද කණගාටුවට පත්වන බව එතුමා පැවසුවේය. මෙම නිවෙස් ගිනි තියපු පිරිස පිළිබඳව තව ටික දිනකින් හෙළිදරව් වනු ඇතැයි එතුමා පැවසුවේය.

පාර්ලිමේන්තුවනේතුවේ කියවා කියවා ඉන්නැතුව අගමැති කම බාරගෙන කටයුතු කරන්න තිබුණා නමුත් කවුරුත් බාර ගත්තෙ නෑ. අවසානේදී රනිල් වික්‍රමසිංහ මහතා අගමැති ධුරය මේ රට වැටී අවස්ථාවේදී බාරගෙන කටයුතු කරන බව එතුමා පැවසුවේය.

මේ රට කොතනට යයිද කියා මා දන්නේ නැහැ.මේ අවස්ථාවේදී කිසිදු කෙනෙකු රටට යහපතක් කරන්නට උවමනාවක් නොමැති බවත්, මේ රටේ පාලකයින් කතා කර කර සිටිනවා හැරෙන්නට වෙන දෙයක් නොමැති බවත් , මේ රට ගොඩ දැමීම සඳහා කවුරුන් හෝ ඉදිරිපත් නොවන්නේ මන්දැයි එතුමා විමසුවේය.

**vi.ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා**

පසුගිය නව වෙනිදා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රබල සාමාජිකයෙක් වන ජගත් මනුවරණ ඇතුළු කණ්ඩායමක් විසින් අපේ පක්ෂයේ නායකතුමාට පහර දීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන බව එතුමා පැවසුවේය.

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලීමක් තියෙනවා කරන්න ඔබතුමා මට වඩා වයසින් බාලයි. නමුත් ඔබත් මාත් දේශපාලන වශයෙන් මේ සභාවට පැමිණියේ සමකාලයේදී මේ වන විට මා දේශපාලනය ටිකක් වෙනස් අයුරකින් සිදුකරගෙන යනවා .මම ඔබතුමාටත් කියන්නේ මේ යන රටාව වෙනස් කරගත්තොත් හොඳින් ජීවත් විය හැකි බව එතුමා පැවසුවේය.

1997 පළවෙනි වතාවට මැතිවරණයට ඔබත් මාත් ,ශාන්ත මන්ත්‍රීතුමා රණවක මන්ත්‍රීතුමාගේ අයියා ඉදිරිපත් වුනා එදා දේශපාලන වශයෙන් සිදුවූ ප්‍රචණ්ඩ සිදුවීම්වලට අපි මැදිහත් වුනේ නෑ .විවිධ අය විවිධ දේ පැවසුවත් එය එසේ උන්නැති බව එතුමා වැඩි දුරටත් සඳහන් කළේය.

නව වෙනිදා සිදුවූ සිද්ධියට අපි වගකීම බාරගන්නේ නෑ කිසිකෙනෙකුට දොස් කියන්නෙත් නැති බව එතුමා පැවසුවේය.

88/89 කාලයේ මා පාසැල් වයසේ සිටියේ එම සිදුවීම් වලට මුහුණ දෙන්නට සිදුවූ බවද, 97 වසරේ මැතිවරණයේදී මාගේ නිවෙසට හානි කළා. එවැනි ක්‍රියා වලට ඇතැම් අවස්ථාවල ඔබතුමාගේ සම්බන්ධ කම් තිබුණා.නමුත් එවැනි දේ දැන් අත්හල යුතු බව එතුමා පැවසුවේය.

මේ සිද්ධියේදී ඔබතුමාලා යම්කිසි දායකත්වයක් අරන් තිබුණා . ඔබතුමා හිටියා, ශාන්ත මන්ත්‍රීතුමා, ඉන්දික මන්ත්‍රීතුමා, ලක්මාල් මන්ත්‍රීතුමා අපි ටී.වී. වලින් දැක්කා .ඒවා ගැන අපි කතා කරන් නැහැ. අපිට අදාල නැහැ. මම ඔබතුමාට අවවාදයක් දෙන්නම් මීන් ඉදිරියටවත් එවැනි දේ සඳහා සහභාගී වන්නට එපා යැයි එතුමා පැවසුවේය. මං හිතාගෙන ඉන්නවා මේ වා දැකලා මාගේ දේශපාලන නායකයා කවදා හරි ජනාධිපති වුනත් වාහනයක් රැගෙන පාර දිගේ ගොස් සතුට ප්‍රකාශ කරන්නෑ කියලා. මිනිසුන්ට එයත් සමහර විට හිතේ අමාරුවක් ඇතිවන්නට කාරණාවක් විය හැකි බව එතුමා පැවසුවේය. වෙනත් පක්ෂ වල සිටි ලක්ෂ 20ක් පමණ ජනතාවක් ගෝඨාභය ජනාධිපති කරවන්න ඡන්දය ලබා දුන්නා ඒ නිසා මිනිසුන්ගෙන් අපි දැන් සැපද කියලා අසන්නේ නැති බව ගරු මන්ත්‍රීවරයා පැවසුවේය.

අපි වෙනස් වෙන්න ඕනි නම් මේවා දැකලා එදා 9 වෙනිදා අගමැතිතුමාගේ කතාවෙන් පස්සේ මේක තමයි වෙලාව ගෝල්ෆේස් බහින්න යනුවෙන් ප්‍රකාශ කිරීම තුළ මෙය සංවිධානාත්මකව සිදු වූ බව කිව යුතු බව එතුමා ප්‍රකාශ කළේය. මේ සිදුවීම ආරම්භයේ සිට අවසානය දක්වා වැරදි බව එතුමා වැඩි දුරටත් සඳහන් කළේය.

ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හොඳ කතාවක් පැවසූ බව සඳහන් කරමින් එතුමා කියා සිටියේ විපක්ෂ නායකතුමා එම අවස්ථාවේදි එතනට යන්නට ඇත්තේ සිදුවීම පිළිබඳව සොයාබලන්නට වෙන්න ඇති නමුත් ඒ අවස්ථාවේදී සිදුවූ දේ සිදු නොවිය යුත්තක් බවත්, නමුත් එතනට එම අවස්ථාවේදී තවත් කෙනෙකු පැමිණියා නමුත් ඒ අයට කිසිවක් සිදු නොවීම පිළිබඳව සිතිය යුතු කාරණාවක් බව එතුමා පැවසුවේය යන්න ගරු මන්ත්‍රීවරයා පවසා සිටියේය.

මේ වන විට බැඳුම්කර වංචාව සිදුකළායැයි පැවසූ පුද්ගලයා අගමැති වී ඇති බවත්, පාස්කු ප්‍රහාරය සිදුවූ අවස්ථාවේදී සිටි පුද්ගලයාද එක්ව සිටින බවත්, පාස්කු ප්‍රහාරය සිදුවන බව දැනගෙන සිටි පුද්ගලයාද එක්ව ඇති බව එතුමා පැවසුවේය.

මෙරටට පැමිණෙන ගෑස් ,තෙල් නැව් සඳහා ගෙවිය යුතු ගාස්තු හා ප්‍රමාද ගාස්තු පිළිබඳව සොයාබැලීමේදී කෝටි විසිදාහක වටිනා නෞකාවක් සඳහා ප්‍රමාද ගාස්තු ලෙස කෝටි 1200ක් ගෙවීමට සිදුවන බවත්, පැවසූ ගරු මන්ත්‍රීවරයා පවසා සිටියේ විරාජ් මන්ත්‍රීතුමා පැවසූ පරිදි ඡන්දයක් තියන්න මුදල් නොමැති බව පැවසීම පිළිබඳව සිතා බැලිය යුතු බවයි.

මේ ඇති වී තිබෙන ප්‍රශ්ණයට විසඳුම් සෙවීමට මේ රට ගොඩ දාන්නට මේ ආකාරයට බැරි බවද, නමුත් මිනිසුන් ඉල්ලන දෙයක් තිබෙනවා ,රාජපක්ෂලා මේ වෙලාවේ පලයන් කියලා. ඒක වෙනකන් මේ රට

ගොඩදාන්නට නොහැති බව ගරු මන්ත්‍රීවරයා පැවසුවේය. විධායක බලය අඩුකරලා පාර්ලිමේන්තුවට බලය දෙන්න ඕනි. එතකොට මේරටට මුදල් එයි යන්න එතුමා පැවසුවේය. අගමැති මාරු කර කරා ඉදලා වැඩක් නැහැ. මේ ගැටළුව තාම ගමට ගිහින් නැහැ. ගමෙත් මේ අර්බුදය ඇති වුනාම ගමේ සමුපකාරයේ ගමේ කඩේ බඩු ටික මංකොල්ල කන්න මිනිස්සු උත්සහ කරනු ඇතැයි එතුමා පැවසුවේය.

ගියවර සභාවේ යෝජනාවක් කරලා තිබුණා මේ අර්බුදය විසඳීම ජනාධිපතිවරයා වෙතට ප්‍රාදේශිය සභා මන්ත්‍රිවරුන් ලෙස සඳහා යෝජනා ඉදිරිපත් කර යොමු කරනවා කියලා . ඒම යෝජනා සකස් කර යවන ලෙසට ගරු මන්ත්‍රීවරයා පැවසුවේය. විසුරුවා හරින්නට පෙර අපේ යෝජනාවලිය සකස් කර යවන ලෙසට එතුමා වැඩිදුරටත් සඳහන් කළේය.

**Vii. ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතා**

විපක්ෂයේ කණ්ඩායමේ පිරිස් පැවසූ ඒවායින් 95%ක් මං පිළිගන්නවා. නමුත් පිළිනොගන්නා 5%කුත් තියෙනවා. අපි එදා කොළඹ ගියෙ කාටවත් ගහන්න නොවෙයි. ජන මාධ්‍යයෙන් පෙන්වන තත්වය නොවෙයි ඒ අවස්ථාවේදී එතන තිබුණෙ. දේශපාලන කරන අවස්ථාවලදී ගැටුම් කරා යොමු නොවුනු බව එතුමා සඳහන් කළේය.

අපි කාටවත් උදව්වක් කරානම් කරා ඇරෙන්න කාටවත් පහර දීමට පෙළපාලී යාමට උත්සහා කර නොමැති බවත්, ඇතැම් අය ගැටුම් ඇවිස්සෙන ආකාරයට කටයුතු කරන බවත් පැවසූ මන්ත්‍රීවරයා පවසා සිටියේ පොත්පත් කියවන ඇතැම් අය පසුගිය සභා වාරයේදී භාවිතා කළ වචන පිළිබඳව සභා වාර්තාවෙන් ගරු උප සභාපතිතුමා විසින් ඉවත් නොකලානම් බලා ගැනීමට තිබූ බවයි. කිසිකෙනෙකුට පහර දෙන්නට නොයන බවත්, නමුත් තමන් පහර කෑමට ලක් නොවන බවත් එතුමා පැවුසුවේය.

එල් ටී.ටී.ත්‍රස්ත්‍රවාදීන්ගෙන් බැට කෑවේ වැඩිපුර ද්‍රවිඩ ජනතාව, එදා මරණ වරෙන්තුව අරන් තමයි කොළඹට ගියේ එදා මිනිසුන් . මැයි 18 වනදා එදා අරගල භූමියේ සිදුවූ දේ ගැන සිතන්න. එතන ගමයි ජාතිවාදී ලෙස හැසිරෙන පිරිස සිටියේ. මොවුන්ට අවශ්‍ය මිනී මැරීම, ලේ හැලීම. අරගල කරුවන්ට විරුද්ධව නැගී සිටි යුතු බවත්, ඔවුන් පරාජය කර ඡන්දයක් පැවැත්වීම සුදුසු බව එතුමා සඳහන් කළේය.

**viii. ගරු මන්ත්‍රී රංජිත් ධර්ම කීර්ති මහතා**

ගිය නව වෙනිදා සිදුවූ සිද්ධිය සම්බන්ධයෙන් එකිනෙකා එක එක පක්ෂ වලට අතදිගු කරමින් තමන් නිවැරදි වීමට උත්සහ ගත්තත් ,අපේ පක්ෂයේ නායක තුමා අගමැති ධුරයෙන් සමුගන්නා අවස්ථාවට සියළුම දෙනාට ආරාධනා කර තිබුණත් මම ශ්‍රී පාද වන්දනාවේ ගොස් සිටි බැවින් එයට සහභාගී වන්නට බැරි වූ බව එතුමා සඳහන් කළේය.

පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව ගිය අයගේ තොරතුරු කෝල් කරමින් ඇසුවා ඒ ගැන ඉතාම සතුටක් දැනෙන බව එතුමා සඳහන් කළේය.ඇතැම් අය හිටියා ගැටුම් ඇතිවන ආකාරයට කටයුතු කරමින් නමුත් ඒවා නතර කරනු ලැබුවා. ඒ අනුව රත්නපුරේ කිසිදු කෙනෙකුට හානියක් වුනේ නෑ.නමුත් බලංගොඩ ප්‍රාේදේශිය සභාවේ සභාපතිවරයාගේ නිවසට හානි කිරීම මං මේ අවස්ථාවේදී හෙලා දකිනවා. එතුමා මේ රැස්වීම සඳහා සහභාගී වුනෙත් නැති බවයි දැන ගන්න ලැබුනේ. නිවසක් ගිනි තියන එක විශාල පාප කර්මයක් මෙවැනි සිද්දී අනුමත නොකරන බව එතුමා පැවසුවේය.

දැනට අවුරුදු 30කට පෙර කුරිරු යුද්ධය පටන් ගත් අවසන් කළේ මහින්ද රාජපක්ෂ මහතායි. එතුමා මේ නික්ම යන අවස්ථාවේ ජාත්‍යාන්තර කුමන්ත්‍රණ ක්‍රියාත්මක වුනු බව එතුමා පැවසුවේය. මෙම ගොල්ෆේස් අරගලය තුළින් රටේ ප්‍රශ්ණ වැඩි වන බවත් ඒ තුළින් විසඳුම් නොලැබෙන බවත්, කොළඹ මිනිසුන්ට මෙතන ධන උල්පතක් බවත්, වැඩක්පළක් නොකර නිකං කාලා බීලා ඉන්න තැනක් බවට පත්වෙලා තිබෙන බව එතුමා පැවසුවේය.

පාරවල් වහගන අරගල කිරීම තුළින් ප්‍රශ්ණ වැඩි වන බව පැවසූ මන්ත්‍රී තවදුරටත් සඳහන් කර සිටියේ ඩීසල් , ගෑස් ගැටළු ලෝකයේ තවත් රටවලටත් බල පෑ ඇති බවයි. මේ ප්‍රශ්ණ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට, මහින්ද රාජපක්ෂ මහත්තයාට පමණක් බැර කර කටයුතු නොකළ යුතු බවත්, සෑම සියළුම දෙනා මේ ගැටළුකාරී තත්වයන්ට වගකිව යුතු බව එතුමා පැවසුවේය. එසේම පවතින මේ ආර්ථික අර්බුදය හමුවේ මේ පළාත් පාලන ආයතනවල ලංකාව පුරා අටදහසක් පමණ මන්ත්‍රීවරුන් පිරිසක් සිටින බවද මෙම ආයතන විසිරුවා හැරීමට යන බව කතාවක් යනවා මම නම් ඒ සඳහා එකඟ වන බව එතුමා පැවසුවේය. එම වැටුප් රටේ සංවර්ධන උදෙසා යොමු වීම යහපත් දෙයක් බව එතුමා පෙන්වා දෙන ලදී.

ජනාධිපතිතුමාගේ ආරාධනයෙන් රනිල් වික්‍රමසිංහ මහතා මේ අවස්ථාවේදී අගමැති ධුරය බාරගනිමින් රට මේ පවතින අර්බුදයෙන් ගොඩ ගැනීම සඳහා උත්සහ දරන අවස්ථාවේදී ඔවුන්ට ඒ සඳහා ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරන ගමන්ම නිවාස ගිනිබත් වී හානි පැමිනුණු සියළුම දෙනාට රත්නපුර ප්‍රාදේශිය සභාවේ ශෝකය මේ අවස්ථාවේදී පුදකර සිටින බව එතුමා පැවසුවේය.

**ix.ගරු උප සභාපති ජී.ජී. පුෂ්පකුමාර මහතා**

රටේ ප්‍රශ්ණ කතා කිරීමට පෙර ගමේ ප්‍රශ්නයක් තියෙනවා ඒ ගැන කතා කළ යුතු බව ගරු උප සභාපතිතුමා පැවසුවේය. ඇල්ලෙගෙදර ප්‍රධාන මාර්ගය සම්බන්ධව මෙම මාර්ගය දැනට අවුරුදු දෙකක පමණ සිට විසල් ජල යෝජනා ක්‍රමයේ බට එළීම සඳහා පළුදු කිරීම සිදුකළා.ඊට පෙර මාර්ගය කාපට් කිරීම සඳහා මුදල් වෙන් කළා කි.මී. 2.5ක් මෙය පළාත් සභා මාර්ගයක්.මෙම මාර්ගයේ බස් රථයක් ගමන් කළා දැන් ඒකත් වැඩ කරන්නේ නැහැ. අක්කර 100 හිදැල්ලන කන්ද ප්‍රදේශය හරියේදී බස් රථය පෙරලෙන්න යනවා. ඒ තරමට පාර අබලන් තත්වයේ තිබෙන්නේ. පාසැල් ළමුන් හා රජයේ සේවකයන් සිටිනවා, ගමේ මිනිසුන් නගරෙට එන්නෙ ඒ බස් රථයෙන් ඔවුන් සියළුම දෙනා අපහසුතාවයට පත් වී තිබෙනවා, මෙම මාර්ගය පලුදු කිරිමෙන් පසුව නැවත ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා මේ පිළිබඳව ආණ්ඩුකාරතුමාට, පළාත් මාර්ග අමාත්‍යාංශට හතර වතාවක් පමණ ගිහින් කතා කළා, මාර්ග සංවර්ධන අධිකාරියට කතා කළා ,නමුත් මේ වන තෙක් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොමැති බවත්, මේ පිළිබඳව සොය බැලීමේදී කාපට් කිරීම සඳහා වත් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වත් ප්‍රතිපාදන වෙන්කර නැහැ.මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් වත් මුදල් බැදිමක් සිදුවී නොමැති බව එතුමා පැවසුවේය. මේ පිළිබඳව පළාත් මාර්ග අමාත්‍යාංශයෙන් හෝ විසල් ජල යෝජනා ක්‍රමය ව්‍යාපෘතියෙන් හෝ විසඳුමක් ලබා ගැනීමට මැදිහත් වන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය මැයි නව වෙනිදා 88/89 කාලේ වගේ අඳුරු දිනයක් කිව්වොත් නිවැරදියි. අනුර කුමාර සහෝදරයා කිව්වා ජනතා විමුක්ති පෙරමුණ සමබන්ධ නැහැ කිව්වා. අරගලය ආරම්භ වුනේ නිර්පාක්ෂිකයි කියලා තමයි ,අරගලය නිර්මාණය වුනේ මේ රටේ තිබෙන අවිධිමත් දේවල් හොඳ පැත්තට හදාගන්න. විශේෂයෙන් අරගලය වියයුත්තේ හරි පැත්තට ගෙනියන්න මෝර්ටිවේෂන් අප්පච්චි,රැට්ටා, පැතුම් කරනල් කියන අය තමයි මෙහි ආරම්භකයන් ඔවුන්ගේ අදහස් වුයේ මේ ආකල්පමය වෙනස් කම් සිදු කිරීමයි. තරුණ පරපුර දේශපාලනය ගේන්න වැඩ පිළිවෙලක් හදමු යැයි කියලා තමයි මම කියවපු අරගලයෙ තිබුනෙ. නමුත් දැන් ආරම්භකයන් පැවසුවේ එක් පක්ෂයක් මෙය බාරගෙන වෙනත් පැත්තකට යොමු කරන බවයි. ජනතා විමුක්ති පෙරමුණ හා අන්තරය කරගෙන යන වැඩ පිළිවෙල පිළිබඳව කණගාටු වන බව එතුමා පැවුවේය. නව වෙනිදා සිද්ධියට ජනතා විමුක්ති පෙරමුණ සම්බන්ධ නොවුනා කියන්න බැරි බව එතුමා පැවසුවේය.

එදා හවස මංකොල්ල කෑමක් සිදුවනේ ජනතා විමුක්ති පෙරමුණට මංකොල්ල කෑම හුරුපුරුදුයි. වගකීමෙන් තමයි මං මේවා කියන්නෙ. එදා කොළඹ ගිහින් එන අය යන එන වෙලාවල්, දැන් ඉන්නෙ කොහෙද කියලා ෆේස් බුක් එකේ ෂෙයාර් වුනු වීඩියෝ වලින් පැහැදිලි වෙනවා කවුද මේ මෙහෙය වුයේ කවුද යන්න බව එතුමා සඳහන් කළේය. මේ සිදුවුනු සිද්ධියෙන් මින් පසුව තරුණ කිසි කෙනෙකු දේශපාලනය නොඑන තත්වයක් සිදු වුනු බව එතුමා සඳහන් කළේය.

**x.ගරු මන්ත්‍රී උදය කුමාර් මහතා**

ගියවර සභාවේ තමන්ගේ අදහස් දැක්වීම දමිළ භාෂාවෙන් පරිවර්තනය කර ලබා දීම පිළිබඳව ස්තුතිය එල කරන බවත්, මෙම ආර්ථික අර්බුදයටත්, ආහාර අර්බුදයටත් ලක්වෙලා තිබෙන මොහොතක අපි සියළුම දෙනා කතා කරන්නේ අතීතය ගැන පමණයි. සිදුවනු අවශ්‍ය නොමැති දේ පිළිබඳව කතා කර කර සිටීම වැඩකට නැති කාරණයක් බව එතුමා පැවසුවේය.

මේ අවස්ථාවේදී වගාවන් සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ජනතාවට ලබා දීම පිළිබඳව සාකච්ඡා කළයුතු බව එතුමා පෙන්වා දුන්නේය. බීජ ලබාදීමට කටයුතු කළයුතු බව එතුමා පෙන්වා දුන්නේය. උපන්දා සිටම ජාතිවාදය ඇති කරලා තිබෙනවා.උප්පැන්න සහතිකයේම ජාතිය සඳහන් කර තිබෙනවා. ශ්‍රීලංකන් ලෙස උප්පැන්න සහතිකය තිබිය යුතු බවත්, අපේ රට යන හැඟීම සැමගේ සිත තුළ තිබිය යුතු බවත් එසේ නොවන තාක් කල් ගොඩ යාමට හැකියාවක් නොමැති බව එතුමා පැවසුවේය.

මැයි නව වෙනිදා සිදුවුනු සිද්ධි පිළිබඳව ඉතාමත් කණගාටු දායක තත්වයක් බව එතුමා පැවසුවේය. දේශපාලන වෛරීය වැඩ . තිරිසන් වැඩ මිනිසුන් නොකළ යුතු බව එතුමා පෙන්වා දුන්නේය. ඉන්දියන් ආධාර අඩු ආදායම් ලාභින්ට ලබාදෙන බව ආරංචි වුනා එක් එක් අයගේ හිතු මනාපයට නෙවෙයි .සුදුසු පුද්ගලයන්ට සියළුම දෙනාට , පක්ෂ භේද වලින් තොරව, ජාතිභේදවලින් තොරව ආධාර ලබා දීමට අවශ්‍ය කටයුතු සළසන මෙන් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

**xi.ගරු සභාපතිතුමා**

සියළුම දෙනා වර්තමාන තත්වය පිළිබඳව කතා කළා ඒ සියළුම දෙනාට ස්තුති වන්ත වන අතර, ඇතැම් කාරණා සම්බන්ධව කරුණු කියන්නට තිබෙනවා, එදා නව වෙනිදා වුනු සිද්ධිය සම්බන්ධයෙන් මා ඉතා පිළිකුළෙන් යුතුව හෙලා දකිනවා. අපේ පක්ෂයේ නායකයා හැටියට අගමැති තුමා හැටියට කළ ආරාධනයෙන් අපි කොළඹ රැස්වීමට ගියා. රටේම සිටි පළාත් පාලන ආයතන නියෝජිතයින් එම අවස්ථාවට සහභාගී වුනා එදා හැමෝගෙම ඉල්ලීම වුනේ අගමැති තුමාට ඉවත් නොවන ලෙසයි. රැස්වීම

අවසානයේ ඒ සියළුම දෙනා පාරට බැස්සේ අගමැති තුමා අපිට ඕනි කියලයි. මම ශ්‍රී පාදයේ ගිහින් කකුල අමාරුවෙන් හිටියෙ නමුත් අනිත් සියළුම දෙනා පෙලපාලියෙ යද්දී අපිටත් යන්න සිද්ධ වුනා . නමුත් මේ අවස්ථාව පෙර සූදානම් කර බාහිරින් පිරිස් කණ්ඩායම් ලෙස පොලු රැගෙන අපිට ගහන්නට සැලසු ම් කළ බවක් ඒ අවස්ථාවන් මාධ්‍ය තුළින් නොපෙන් වූවත් අපිට දක්නට ලැබුණා . ඒ හේතුවෙන් ගමයි මේ අවස්ථාවේ ගැටුමක් නිර්මාණය වුනේ.ඒ ගැටුම ඇති වුනේ එම ස්ථානයේදී පමණයි.

නමුත් රට පුරා සිද්ධ වුනු අපරාධ වලට වගකිව යුත්තේ කවුද? ඒවා මෙහෙය වූයේ කවුද? යන්න ගරු සභාපතිතුමා විමසුවේය. රොහාන් මන්ත්‍රී තුමා ෆේස්බුක් එකේ දාලා තිබුණු ෆොටෝ වලට තමයි මිනිස්සු කමෙන්ට් කරලා තිබුණෙ. මේ වෙලාවෙ මේ පාරෙන් එන්නෙ, ගෙවල් තියෙන්නේ අහවල් තැන යනුවෙන් . මං ඒ අවස්ථාවේදිම ඇතැම් අයට කොල් කළා. තර්ජනය කරන්න නොවෙයි. මොකද මේවා දැම්මේ අහන්න. නමුත් ආන්සර් කළේ නැහැ. ඒ නිසා කමෙන්ට් කරන්න වුනා ඒවට උත්තර දෙන්න . මං ගෙදර ඉන්නෙ ඕන කෙනෙක් එන්න කියලා මං කිව්වා ආවනම් කිසි කෙනෙක් යවන්නෙත් නැති බව පැවසූ ගරු සභාපතිතුමා කියා සිටියේ මේ සභාවේ වගකීමෙන් කියන්නේ කිසි කෙනෙකුට තමන් බිය නොවන බවයි.

ලලිත් මන්ත්‍රීතුමා අවවාදයක් ලබා දුන්නා , අපි එක කාලයේ තමයි සභාවට පැමිණියේ. තම්බිරාජා මන්ත්‍රිතුමාත් අපි හොඳින් හිතවත්ව ඇසුරු කරනවා ජාති භේද කිසිවක් නැහැ. ඕනෑම ජාතියක වසල වැඩ කරන පිරිසක් ඉන්නවා. අපේ කණ්ඩායමේත් එවැනි පිරිසක් සිටින බව එතුමා පැවසුවේය. ඔය කතා කරන මිනිස්සුන්ගෙ හදවතේ කවුද ඉන්නෙ කියලා හිතාගන්න පුළුවන් ඔය පිටට මාධ්‍ය ඉස්සරහා මන්ත්‍රීවරු ඉස්සරහා පෙන්නන සුන්දර ලෝකය ඇතුලේ නොමැති බව එතුමා පැවසුවේය. 97 කාලයේ නිවෙස් පුච්චපු එක මගේ ඇස් දෙකෙන් දැක්කා අදටත් ඒ නඩුව තියෙනවා රණවක මන්ත්‍රීතුමාවත් ,මමවත් වැලිකැටයක් තරමට ගැහැව්වෙ නැහැ . දේශපාලනය කරපු අය තරහා පිරිමහා ගැනීම සඳහා මාලේ නම දාලා වැරදි කරුවෙක් කරන්නට උත්සහා කරනු ලැබුවා. නමුත් සොභා දහමට අනුව ඔවුන්ට දඬුවම් ලැබෙනු ඇතැයි එතුමා පැවසුවේය. අද වන විට ඒ මිනිස්සු කන්න නැතුව පන පිටින් විඳවන බවත්, තමන්ට පාරේ ගියත් කන්න බොන්න කතා කරන ජනතාව සිටින බව එතුමා පැවසුවේය.

ගිනි ගන්න කඩවල් ආරක්ෂා කරන්න ඒ වෙලාවෙ කටයුතු කළ අපිටම හිරේ යන තත්වෙට පත් කළා . ලලිත් මන්ත්‍රීතුමා සුනිල් යන පුද්ගලයෙකුට කියලා සුගතුයි, ජනකයි ගිනි තියනවා දැක්කා කියලා කියන්න කියලා මාස හත හමාරකට හිරේ දැම්මා නමුත් ඒ පුද්ගලයාම ගොස් නැවත අසාධියේදී බොරු සාක්ෂි දුන් බවට පිළිගත් නිසා එම නඩුවෙන් නිදොස් කොට නිදහස් වෙන්න ලැබුණ බව එතුමා සඳහන් කළා.

මේවා සභාවේදී කියන්න බලාපොරොත්තුවක් තිබුන් නැහැ නමුත් අවවාද දෙන කොට නයි රෙද්ද අස්සේ ඉන්නවා කියලා අපිට දැනෙනවා. අවවාද දෙන්න ඒ අය ආදර්ශයෙන් සිටිය යුතු ඉව එතුමා පැවසුවේය. මගේ පළමු දරුවා බිහිවෙන්න හිටියෙ . දරුවගේ උප්පැන්නයට නම දාගන්න විශ්වයෙන් අපිව නිදහස් කළා .එවැනි කරදරවලට අපිව යොමු කළා .නමුත් මේ අවස්ථාවේදී මං කැමති නැහැ ජනතා විමුක්ති පෙරමුණ සිදුකළ ක්‍රියාවලියට.

මේ ආර්ථික අර්බුදය සියළුම දෙනාට බලපෑම තියෙනවා. මේවා ගෝඨාභය රාජපක්ෂවත්, මහින්ද රාජපක්ෂවත් කරපුවා නෙවෙයි.අවුරුදු 74ක පාලන කාලය තුළ විවිධ පාලකයින් විසින් සිදුකරපු ඒවායේ ප්‍රථිඵල තමයි මේ. පළාත් සභාවේ සිටි අය වත් ප්‍රාදේශිය සභාවේ සිටි අයවත් සිදු කළ ඒවා නෙවෙයි. අපිට තනියම වැරදි කරන්න බැහැ ලේකම්, විෂය නිලධාරීනුත් වග කියන්න ඕනි. රටක් හැටියට මෙ සියළුම දෙනාම වග කිව යුතුයි.

එදා මැරුණු මන්ත්‍රීවරයාගේ ඩ්‍රයිවර්ගේ මුදල් ගත්තේ ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ අය බව හෙලි දරව් වුනා. එදා කලෙත් මේ දේම තමයි. එදා කොයිතරම් නම් විනාශයක් සිදුකළාද .මේ පිටිපස්සෙත් ජනතා විමුක්ති පෙරමුණ සිටින බව එතුමා පැවසුවේය. ජනතා විමුක්ති පෙරමුණ විතරක් නෙවෙයි අන්තවාදී දෙමළ මුස්ලිම් මිනිසුන් සිටින බවත්, මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ ගිහින් රට විනාශය කරා යන විට කාටත් දැනෙනු බවත්, මේ අන්තවාදීන්ගේ අදහස් ටික ඉටුවෙනකොට සියළුම දෙනාටම තේරෙන බව එතුමා පැවසුවේය.සභාවට පත් වූදා සිට නොයෙකුත් බාධක මාධ්‍යෙය් කටයුතු සිදුකළ බවත් ඒ පිළිබඳව සතුටු විය හැකි බවත් එතුමා පැවසුවේය.

අද සහභාගී වී අදහස් දැක්වූ සියළුම දෙනාට ස්තුතිය එල කරමින් සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක**
**සභාපති**
**රත්නපුර ප්‍රාදේශීය සභාව**